කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2021

2024 - අගෝස්තු

**BCOM E 4032 - දැනුම් කළමනාකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව තුනයි : (03) කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

උපදෙස්

- කරුණාකර ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ඒ සඳහා වෙන් කර ඇති ලකුණු සැලකිල්ලට ගන්න.
- ප්‍රශ්න වලට සැමවිටම කෙටි වාක්‍ය/කරුණු වශයෙන් (point form) හෝ කෙටි ඡේදවලින් පිළිතුරු සපයන්න. අවශ්‍ය අවස්ථාවලදී රූප සටහන් භාවිතා කරන්න.
- අවශ්‍ය තැන්වල ඔබේ උපකල්පන සඳහන් කරන්න.
- මුළු ලකුණු - 100

**ප්‍රශ්න අංක - 01**

**මිරකල් ෆිට් ජිම් (MiracleFit Gym) හි සිද්ධි අධ්‍යයනය**

පසුබිම:

MiracleFit Gym (MF) වසර පහකට වැඩි කාලයක් ප්‍රජාව තුළ ජනප්‍රිය යෝග්‍යතා මධ්‍යස්ථානයක් (Fitness Center) වී ඇති අතර එය එහි මිත්‍රශීලී පරිසරය සහ පුද්ගලාරෝපිත (personalized) සේවාව සඳහා ප්‍රසිද්ධය. ඔවුන් එහි සාර්ථකත්වයට දායක වූ කාර්ය මණ්ඩලය සහ සාමාජිකයින් අතර ඇති ශක්තිමත් සබඳතාව ගැන ආඩම්බර වේ. මෑතකදී, ප්‍රධාන සේවකයින් තිදෙනෙක් ව්‍යායාම් ශාලාවේ රැකියාවෙන් ඉවත් වීමට තීරණය කර ඇත. මෙම හදිසි දැනුම්දීම MF ආයතනයේ සේවාවේ ගුණාත්මක භාවය සහ සාමාජිකයින්ගේ තෘප්තිය පවත්වා ගැනීම සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

ජිම් උපදේශක: ෂෙවින් පෙරේරා

ෂෙවින් යෝග්‍යතා උපදේශකයෙකු ලෙස මීට මාස හයකට පෙර MF ආයතනයට සම්බන්ධ විය. ඔහු ප්‍රමුක පෙළේ විශ්ව විද්‍යාලයකින් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපාධිය සම්පූර්ණ කර ඇති අතර අදාළ ක්ෂේත්‍රයෙහි මාස 6 ක සීමාවාසික පුහුණුවක් ද සම්පූර්ණ කර ඇත. සාපේක්ෂ වශයෙන් නවකයෙකු වුවද, ඉගෙනීමට සහ නව්‍යකරණය කිරීමට ඇති උනන්දුව නිසා ඔහු ඉක්මනින් කණ්ඩායමේ වටිනා සාමාජිකයෙකු බවට පත්ව ඇත. ෂෙවින් නවතම යෝග්‍යතා ප්‍රවණතා පිළිබඳ මාර්ගගත පාඨමාලා සඳහා නිතිපතා ලියාපදිංචි වන අතර

වෛද්‍ය සහ යෝග්‍යතාවයට අදාළ ලිපි කියවයි. ඔහු නව ව්‍යායාම අත්හදා බැලීමට සහ ඒවා තම සේවාදායකයින්ට හඳුන්වා දීම ඉතා කැමැත්තෙන් සිදු කරයි. එබැවින් විවිධත්වය අගය කරන ව්‍යායාම් ශාලාවේ සාමාජිකයින් අතර ඔහු ජනප්‍රිය චරිතයකි. ෂෙවින්ගේ ඉවත් වීමෙන් සාමාජිකයින් නිරතුරුව අපේක්ෂා කරන විවිධත්වයෙන් යුත් ව්‍යායාම වැඩසටහන් ඉගෙන ගැනීමේ අවස්ථාව නැතිවී යයි.

පිළිගැනීමේ නිලධාරිනිය : විශ්මි කුරේ

විශ්මි MF ආයතනය ආරම්භයේ සිටම ආයතනයට සම්බන්ධ වී සිට ඇත. ඇතැම් සාමාජිකයන් පවසන්නේ ඇය එම ආයතනයේ ජීවය ලෙසයි. ඒ ඇයගේ සිනහ පිරි මුහුණත් ශක්තිමත් පුද්ගල සම්බන්ධ තා කුසලතාවනුත් නිසාය. ඇය සමාගගේ වඩාත්ම සුහදශීලී හා සැවොම ආදරය කරන අද්විතීය චරිතයක් බවට පත් වී ඇත. සාමාජිකයින්ගේ රුචි අරුචිකම් සහ යෝග්‍යතා ඉලක්ක පිළිබඳ විශ්මිගේ ගැඹුරු දැනුම සාමාජිකයින් නැවත නැවතත් පැමිණීමට සිතෙන ඉතා මිත්‍රශීලී පසුබිමක් නිර්මාණය කර ඇත.

විශ්මිගේ ඉවත් වීමෙන් විය හැකි අලාභය හුදෙක් දෛනික කටයුතු සඳහා වන පාඩුවක් පමණක් නොව සාමාජිකයන් හා පැවති ශක්තිමත් බැඳීම බිඳ වැටීම පිළිබඳ ප්‍රශ්නයකි. සාමාජිකයින්ගේ යෝග්‍යතා ඉලක්ක සහ පෞරුෂයන් පිළිබඳ ඇයගේ ගැඹුරු අවබෝධය සාමාජිකයින්ට සුවපහසුවක් දැනීමට සහ ව්‍යායාම් ශාලාව සමඟ දිගුකාලීන සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට උපකාර වී ඇත.

සහකාර පුහුණුකරු: ඉයන් සිල්වා

ඉයන් සහකාර පුහුණුකරුවෙකු ලෙස පසුගිය වසර දෙකක කාලය තුළ MiracleFit Gym හි සේවය කර ඇත. විශ්මි තරම් නිහඬ දැනුමක් ඔහු සතුව නොමැති වුවද, ඔහු ද ආයතනයේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඉයන් පුද්ගලික පුහුණු සැසි (personal training session) සඳහා සහය දක්වයි; උපකරණ නඩත්තු කිරීම සඳහා උපකාර කරයි; සහ ව්‍යායාම ශාලාවේ මෙහෙයුම් සඳහා සහාය වේ. ඔහු ව්‍යායාම් ශාලාවේ දෛනික චර්යාවන් හොඳින් දන්නා අතර අමතර අවධානයක් හෝ දිරිගැන්වීමක් අවශ්‍ය සාමාජිකයින් ට සහයෝගය දක්වයි.

ඉයන් ගේ ඉවත් වීම එදිනෙදා මෙහෙයුම් පෙර පරිදි පවත්වාගෙන යාමට බාධාවක් වන අතර ඔහු බොහෝ විට ව්‍යායාම උපදේශකයින් සහ සාමාජිකයින් අතර ඇති පරතරය අඩු කරයි.

ෂෙවින්, විශ්මි සහ ඉයන්ගේ ඉවත්වීම MiracleFit Gym ආයතනයෙහි සැලකිය යුතු රික්තයක් ඇති කළ හැකිය. සාමාජිකයින්හට විශ්මි සහ ඉයන් වෙතින් ලැබුණු පුද්ගලික අවධානය සහ ෂෙවින්ගේ නව ව්‍යායාම සැලසුම් නොමැතිව ව්‍යායාම් ශාලාවට පැමිණීමට අඩු පෙළඹවීමක් දැනිය හැකිය. මෙය සාමාජිකයින්ගේ තෘප්තිය අඩුවීමට සහ ව්‍යායාම් ශාලාවේ සාමාජිකත්වය අඩුවීමට හේතු විය හැක.

ෂෙවින්, විශ්මි සහ ඉයන්ගේ ඉවත්වීම MF ආයතනයට සැලකිය යුතු අභියෝගයක් ඉදිරිපත් කරයි. කෙසේ වෙතත්, ක්‍රියාකාරී දැනුම හුවමාරුව සහ ශක්තිමත් දැනුම් කළමනාකරණ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම මගින්, MF ආයතනයට එහි බලපෑම අවම කර ගැනීමට සහ එහි සාමාජිකයින්ට උසස් තත්ත්වයේ, පුද්ගලීකරණය කළ (personalized) සේවාවක් අඛණ්ඩව ලබා දිය හැකිය.

සටහන්: මෙහි සාමාජිකයන් යනු MF ආයතනයෙහි පාරිභෝගිකයන් වේ.

අ. **නිශ්ශබ්ද දැනුම** (tacit knowledge) සහ **පැහැදිලි දැනුම** (explicit knowledge) යනු කුමක්ද?

(ලකුණු 04)

ආ. සංවිධානය පිළිබඳ නිහඬ දැනුමක් ඇති මෙම ප්‍රධාන සේවකයන් අහිමි වීමෙන් ආයතනයට ඇති වන බලපෑම් මොනවාද? එක් එක් පුද්ගලයාගේ එක් බලපෑමක් බැගින් සඳහන් කර එය විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. ඉහත ඡේදයේ කරුණු මත පදනම්ව, එක් එක් පුද්ගලයාගේ දැනුම

i. එම දැනුම ලබාගත් ආකාරය

ii. එය නිහඬ දැනුමක් (tacit knowledge) හෝ පැහැදිලි දැනුමක් (explicit knowledge) ද යන බව සඳහන් කරන්න.

iii. ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

ඔබේ පිළිතුර ඉදිරිපත් කිරීමට ඔබට වගුවක් භාවිතා කළ හැකිය.

(ලකුණු 18 )

ඉ. මෙම සේවකයන්ගේ නිහඬ දැනුම පැහැදිලි දැනුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රම 3ක් න්‍යායාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඊ. අනාගත දැනුම අහිමි වීමේ අවදානම වම කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග මොනවාද?

(ලකුණු 08)

උ. සාර්ථක දැනුම හුවමාරුවක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සාදන්න. අවම වශයෙන් කරුණු 4ක් වත් සඳහන් කරන්න.

(ලකුණු 08)

උෟ. ඔබට ෂෙවින් හෝ ඉයන් රඳවා ගැනීමට අවස්ථාව ලැබුණහොත් ඔබ රඳවා ගන්නේ කාවද? ඉගෙන ගත් දැනුම කළමනාකරණ සංකල්ප හා සම්බන්ධ ඔබේ පිළිතුර (කරුණු 3ක් මගින්) පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 60)

ප්‍රශ්න අංක - 02

අ. හොඳ දැනුම් කළමනාකරණ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයතනික ව්‍යුහය බලපාන්නේද? එසේ නම් ඒ කෙසේද? උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 06)

ආ. "සාමාන්‍ය දැනුම (පොදු දැනුම) සංවිධානයේ සාමාජිකයන් තුළ අභ්‍යන්තර බැඳීම වැඩි කරයි". මෙම ප්‍රකාශය දැනුම් කළමනාකරණ යටිතල පහසුකම් යටතේ සාකච්චා කෙරන "පොදු දැනුම (Common knowledge) ඇසුරින් පහදන්න.

(ලකුණු 07)

ඇ. සේවා සංවිධානයක (Service Organization) ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස ඔබ ඔබේ ආයතනය තුළ දැනුම කළමනාකරණ භාවිතයන් වර්ධනයට පහසුකම් සපයන්නේ කෙසේද?

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

අ. බාහිරකරණය හා අභ්‍යන්තරකරණය යනු කුමක්ද? උදාහරණ 2 බැගින් සඳහන් කර එම උදාහරණ ඇසුරින් පහදන්න.

(ලකුණු 06)

ආ. දැනුම් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන කොටස් දෙකක් වන දැනුම සොයා ගැනීම හා දැනුම බෙදා ගැනීම, එහි අනු කොටස් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ. දැනුම් කළමණාකරන ක්‍රියාවලි යනු මොනවාද? දැනුම් කළමණාකරන විසඳුම් සහ දැනුම් කළමණාකරන පදනම් භාවිතයෙන් පැහැදිලි කරන්න. තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ඔබට රූප සටහනක් භාවිතා කළ හැකිය.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)